# ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය පිළිබඳ අධ්‍යයනය

## ( අධ්‍යාපන මට්ටම අනුව )






මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

කේ.යූ.අයි.විජේවර්ධන

සංවර්ධන නිලධාරී

## ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය ( අධ්‍යාපන මට්ටම අනුව )

***හැඳින්වීම***

ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාවන්ට අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය ලෙස හඳුන්වනු ලබන්නේ වැඩ කරන වයසේ ජනගහනය අතරින් රැකියාවක යෙදී නොසිටින හෝ රැකියාවක් සොයනු නොලබන ජනගහනයයි. වයස අවුරුදු 10 ට වැඩි ජනගහනය අතුරින් පූර්ණ කාලීන ශිෂ්‍යයන් , ගෘහණියන් , විශ්‍රාමික හෝ වයස් ගත පුද්ගලයින් හා ආබාධිත පුද්ගලයින් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී නොවන පුද්ගලයින් ලෙස අර්ථ ගන්වනු ලැබේ.

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2016 ,2017 ,2018 ශ්‍රමබල සමීක්ෂණ වාර්තාවන්ට අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය පහත පරිදි වේ.

***ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය ප්‍රතිශතයක් ලෙස***

| ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| | 46.2 % | 45.9 % | 48.2 % |

වගු අංක : 01

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉහත වර්ෂයන්හි ප්‍රතිශත දෙස බැලීමේ දී ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය 2017 වර්ෂයේ දි පහළ බැස ඇති අතර එය 2018 වර්ෂය වන විට නැවත වැඩි වීමක් දක්නට ලැබේ.

***ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව***

| වර්ෂය | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|
| 2016 | 24.7 % | 75.3 % |
| 2017 | 25.5 % | 74.5 % |
| 2018 | 25.9 % | 74.1 % |

වගු අංක : 02

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2016 , 2017 හා 2018 වර්ෂයන් හි ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ශ්‍රමබල සමීක්ෂණ වාර්තාවන්ට අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ස්ත්‍රී ජනගහනය වර්ෂයෙන් වර්ෂයට ක්‍රමයෙන් අඩු බවක් පෙන්නුම් කරන අතර ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන පුරුෂ ජනගහනයට වඩා වැඩි ය.

ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය කෙරෙහි බලපාන සාධක අතර අධ්‍යාපන මට්ටම පහළ තත්වයක පැවතීම ප්‍රධාන වේ.

***ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය - අධ්‍යාපන මට්ටම් අනුව***

| අධ්‍යාපන මට්ටම | ස්ත්‍රී පුරුෂ භාවය - 2016 | | ස්ත්‍රී පුරුෂ භාවය - 2017 | | ස්ත්‍රී පුරුෂ භාවය - 2018 | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| 5 ශ්‍රේණිය සහ ඉන් පහළ | 19.8 % | 20.2 % | 18.6 % | 19.3 % | 18.6 % | 18.9 % |
| 6 ශ්‍රේණියේ සිට අ.පො.ස (සා.පෙ.) තෙක් | 44.7 % | 46.5 % | 43.5 % | 45.3 % | 42.0 % | 44.1 % |
| අ.පො.ස (සා.පෙ.) සමත් | 24.4 % | 20.4 % | 25.8 % | 22.1 % | 26.8 % | 22.6 % |
| අ.පො.ස (උ.පෙ) හා ඉන් ඉහළ සමත් | 11.1 % | 12.9 % | 12.1 % | 13.3 % | 12.8 % | 14.5 % |

වගු අංක : 03

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉහත වර්ෂ තුනෙහි ම තොරතුරු පිළිබඳ සැසඳීමේ දී ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනයේ ඉහළ ම අධ්‍යාපන ප්‍රතිශතය වාර්තා වන්නේ 6 සිට 10 දක්වා ශ්‍රේණියේ අධ්‍යාපන මට්ටමේ සිටින ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම වන අතර අ.පො.ස (උ.පෙ) හා ඉන් ඉහළ පිරිස අවම මට්ටමක පවතී.

අධ්‍යාපන මට්ටම දෙස බැලීමේ දි 5 ශ්‍රේණියේ සහ ඉන් පහළ , 6 ශ්‍රේණියේ සිට අ.පො.ස (සා.පෙ) දක්වා පිරිස ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. අ.පො.ස (සා.පෙ) සමත් හා අ.පො.ස (උ.පෙ) හා ඉන් ඉහළ පිරිස ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී.

අධ්‍යාපනය යනු පුද්ගලයා තුළ දැනුම , කුසලතා , ආකල්ප වර්ධනය කිරීමේ ක්‍රියාවලියකි.ආර්ථිකය ඉතා සීඝ්‍රයෙන් දියුණු වන විට අධ්‍යාපනය ද ඊට සරිලන අයුරින් සංවර්ධනය වීම අවශ්‍යය.අධ්‍යාපනය පරිපූර්ණ මිනිසෙක් බිහි කිරීමට අවශ්‍ය ඉගෙනීම,ඇගයීම පුහුණුව ලබා දෙයි.අධ්‍යාපන මට්ටම ,රැකියාව හා ආදායම එකිනෙකට බැඳී පවතී.ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම පැහැදිලි සාර්ථකත්වයක් ලබා තිබුන ද ශ්‍රම වෙළඳපොළ සඳහා දායක කර ගැනීම අභියෝගයක්ව පවතී.

ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය සඳහා අධ්‍යාපන කටයුතු වල නිරත වන ස්ත්‍රී පුරුෂ දෙපිරිස ම ඇතුළත් වේ.

| අධ්‍යාපන කටයුතු වල නිරත වීම | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| | 38.4 % | 14.3 % | 39.6 % | 15.4 % | 40.9 % | 15.8 % |

වගු අංක : 04

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉහත වගු සටහනට අනුව පුරුෂ පාර්ශවය අධ්‍යාපන කටයුතු වල නිරත වීමේ වැඩි ප්‍රතිශතයක් දක්නට ලැබේ.කාන්තාවන් බොහෝ දෙනෙක් ගෙදර වැඩ කටයුතු වලට සම්බන්ධ වීම නිසා අධ්‍යාපන කටයුතු වල නියැලීමේ අඩු ප්‍රතිශතයක් දක්නට ලැබේ.

***විවරණය***

- මෙම අධ්‍යයනයට අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනයෙන් වැඩි පිරිසක් ස්ත්‍රී පාර්ශවය නියෝජනය කරනු ලබන බවයි.

- පූර්ණ කාලීන අධ්‍යාපනයක් ලබන පිරිස ආර්ථිකමය කටයුතු වල නියැලීමට දිරිගැන්වීම වෙනුවට ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවයන්ට ගැළපෙන ආකාරයෙන් අධ්‍යාපනය ව්‍යුහගත කිරීම මඟින් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය අවම කර ගත හැකිය.

- ලබා ඇති අධ්‍යාපන මට්ටම් අනුව වයස අවුරුදු 60 ට වැඩි, වැඩිහිටි පිරිස හා විශ්‍රාමික පිරිස නිවසේ සිට නිරත විය හැකි ආදායම් උත්පාදන මාර්ග සඳහා යොමු කිරීමට දිරිමත් කිරීම.